මැතිවරණ කොමිෂන් සභාව
தேர்தல் ஆணைக்குழு
Election Commission
Election Secretariat, No.02 Sarana Mawatha, Rajagiriya, Sri Lanka

මාධ්‍ය නිවේදනය
ஊடக அறிவித்தல்
MEDIA RELEASE

**මාධ්‍ය නිවේදන අංක :PRE/2024/95** **2024.09.19**

## ජනාධිපතිවරණය - 2024 සැප්තැම්බර් 21
### ඡන්ද විමසීම පවත්නා දිනයෙහි තහනම් ක්‍රියා

ජනාධිපතිවරණ ඡන්ද විමසීම පවත්වන දින, ඒ ඡන්ද පොළ සීමාව ඇතුළත දී හෝ ඒ ඡන්ද පොළට ඇතුළුවන දොරටුවේ සිට කිලෝ මීටර භාගයක දුර ප්‍රමාණයක් ඇතුළත දී කිසිම තැනැත්තකු විසින් පහත දැක්වෙන ක්‍රියා අතුරින් කිසිවක් නොකළ යුතු බවත් එම විධිවිධාන කඩකරන සෑම තැනැත්තෙකුටම දඩුවම් පැමිණ විය හැකි බවත් නිවේදනය කරනු ලැබේ.

- ඡන්ද ආයාචනා කිරීම;
- යම් ඡන්ද හිමියකුගේ ඡන්දය ඉල්ලීම;
- යම් නිශ්චිත අපේක්ෂකයකුට ඡන්දය නොදෙන ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීම;
- තෝරා පත්කර ගැනීමේ දී ඡන්දය නොදෙන ලෙස යම් ඡන්ද හිමියකු පෙළඹවීම;
- තෝරා පත්කර ගැනීමට අදාළව, (යම් නිල අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, ඡායාරූපයක් හෝ චිත්‍රයක් හෝ දැන්වීමක් නොවන) යම් අත් පත්‍රිකාවක්, ප්‍රදර්ශන පත්‍රයක්, දැන්වීම් කොළයක්, ඡායාරූපයක් හෝ චිත්‍රයක් හෝ දැන්වීමක් හෝ යම් අපේක්ෂකයකුට වෙන් කර ඇති යම් ලකුණක් බෙදා දීම හෝ ප්‍රදර්ශනය කිරීම.

**ආර්.එම්.ඒ.එල්.රත්නායක**
**සභාපති, මැතිවරණ කොමිෂන් සභාව**
**(මැතිවරණ කොමිෂන් සභාව වෙනුවෙන්)**